# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1877/79 - 2014 අගෝස්තු මස 29 වැනි සිකුරාදා - 2014.08.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**බොල්තුඹේ සමන් දේවාල පූජනීය ප්‍රදේශය පූජාභූමියක් ලෙස ප්‍රකාශයට පත් කිරීම**

අංක 1681/3 හා 2010 නොවැම්බර් මස 22 වැනි සඳුදා අති විශෙෂ ගැසට් පත්‍රයේ
පළ කරන ලද නියමය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1681/3 - 2010 නොවැම්බර් මස 22 වැනි සඳුදා ප්‍රසිද්ධ කරන ලද අති විශෙෂ ගැසට් පත්‍රය මඟින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් කරන ලද නිවේදනය පරිදි බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය ආචාර්ය දිසානායක මුදියන්සේලාගේ ජයරත්න වන මා හට පැවරී ඇති පූජාභූමි සැලසුම්කරණය හා සංවර්ධනය විෂයය ප්‍රකාරව මෙහි උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන ඉඩම් ප්‍රදේශයේ චිරාත් කාලීන සුරක්ෂිත බව සඳහා එම ප්‍රදේශය පූජනීය ප්‍රදේශයක් බවටත් එය ''බොල්තුඹේ සමන් දේවාල පූජාභූමිය'' යනුවෙන් හඳුන්වනු ලැබිය හැකි බවටත් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ආචාර්ය දි.මු. ජයරත්න,
බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍ය.

2014 අගෝස්තු මස 20 වැනි දින,
බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය,
අංක 135, අනගාරික ධර්මපාල මාවත,
කොළඹ 07.

*උපලේඛනය*

*බොල්තුඹේ සමන් දේවාලපූජා භූමිය සංයුක්ත වන ප්‍රදේශය*

මිනින්දෝරු ජනරාල්ගේ 2010 මාර්තු මස 12 වැනි දින පිඹුරු අංක R/IMB/2010/159, දරන සැලැස්මේ කැබලි අංක 22 ලෙස හඳුන්වන සබරගමු පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඩවත කෝරළේ උඩුවග්ගම් පත්තුව සුළු කොට්ඨාසයේ, කොට්ඨාස අංක 267, බොල්තුඹේ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, බොල්තුඹේ හෙවත් දේවාලේගම ග්‍රාමයේ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.9571 ක් විශාලත්වයෙන් යුතු පහත දැක්වෙන පරිදි මායිම් වූ මුළු ප්‍රදේශය.

**(කැබලි අංක 22)**

| | | |
|---|---|---|
| උතුරට | : | කැබලි අංක 10 හා 6; |
| නැගෙනහිරට | : | කැබලි අංක 10 හා 6; |
| දකුණට | : | කැබලි අංක 10 හා 6; |
| බස්නාහිරට | : | කැබලි අංක 10, 7 සහ 3. |

09 - 502


1A - G 20177 — 50 (2014/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*